# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/28 - 2014 අගෝස්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2014.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 888/2 දරන හා 1995 සැප්තැම්බර් මස 12 වැනි දින අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරනු ලැබූ සංශෝධනයන් අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ටී. එම්. එල්. සී. සේනාරත්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2014 අගෝස්තු මස 28 වැනි දින.

| | | | | |
|---|---|---|---|---|
| 01. | **ක්‍රියාත්මක වන දිනය** | : | මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2013.04.05 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය. | |
| 02. | **පත්කිරීම් බලධරයා** | : | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | |
| 03. | **සේවා ගණය/සේවා ගණ** | | | |
| | 3.1 සේවා ගණය | : | විධායක<br>ජ්‍යෙෂ්ඨ විධායක | |
| | 3.2 ශ්‍රේණි | : | විධායක | III ශ්‍රේණිය |
| | | | විධායක | II ශ්‍රේණිය |
| | | | විධායක | I ශ්‍රේණිය |
| | | | ජ්‍යෙෂ්ඨ විධායක | විශේෂ ශ්‍රේණිය |

04. **කාර්ය භාරය :**

ආයතන ප්‍රධානියා වෙත පැවරෙන වාස්තු විද්‍යාඥ කාර්ය භාරයට අදාළ වූ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ආයතනයේ ප්‍රධානියා විසින් නිශ්චිත කොට පවරා දෙනු ලබන වාස්තු විද්‍යාඥ විෂය ක්ෂේත්‍රයට අයත් නිර්මිත පරිසරය, වාස්තු විද්‍යා

නිර්මාණකරණය හා උපදේශනය, ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිත ව්‍යාපෘති කළමනාකරණය, පුරා විද්‍යාත්මක වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ වැනි කටයුතු මෙම සේවාවේ තනතුරු දරන්නන් විසින් ඉටු කරනු ලැබිය යුතු ය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය — විධායක - SL-1-2006
ජ්‍යෙෂ්ඨ විධායක - SL-3-2006

5.2 වැටුප් පරිමාණය — විධායක - SL-1-2006 - රු. 22,935 - 10x645 - රු. 8x790 - 17x1050 - රු. 53,555
ජ්‍යෙෂ්ඨ විධායක - SL-3-2006 - රු. 42,390 - 12x1310 - රු. 58,110

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III ශ්‍රේණිය | 1 වන පියවර (SL-1-2006) | රු. 22,935 |
| II ශ්‍රේණිය | 12 වන පියවර (SL-1-2006) | රු. 30,175 |
| I ශ්‍රේණිය | 20 වන පියවර (SL-1-2006) | රු. 36,755 |
| විශේෂ ශ්‍රේණිය | 1 වන පියවර (SL-3-2006) | රු. 42,390 |

සටහන : ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලබන අවස්ථාවේදී පූර්ණ වෘත්තීය සුදුකම් (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) හෝ බඳවා ගැනීමෙන් පසු එම තත්ත්වය ලබාගත් විට එම නිලධාරියා සේවයේ එම ශ්‍රේණියේ 5 වන වැටුප් පියවරේ පිහිටවනු ලැබේ. එවැනි නිලධාරියකු වුවද සේවයට බැඳී වසර 3ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

06. සේවාවට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව

| *අනුමත තනතුර* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|
| III/II ශ්‍රේණියේ තනතුරු | 50 | වාස්තු විද්‍යා නිර්මාණකරණයට හා ඊට අදාළ ව්‍යාපෘති කළමනාකරණය, ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන්ගේ වැඩ අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම |
| I ශ්‍රේණියේ තනතුරු | 05 | |
| විශේෂ ශ්‍රේණියේ තනතුරු | 01 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව — 51 (III/II, I)
01 (විශේෂ ශ්‍රේණිය)

ශ්‍රේණියෙන් ශ්‍රේණිය උසස් කිරීමේ කාර්ය සඳහා III/II, I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් සේ සැලකේ.

6.3 තනතුරෙහි ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

07. **බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා අනුපාතය

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 75% |
| සීමිත | 25% |
| කුසලතා | - |

සටහන : සීමිත ධාරාව යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී එම ප්‍රමාණය ද විවෘත ධාරාව යටතේ බඳවා ගැනේ.

7.2 විවෘත තරඟ විභාගයෙන් බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක වාස්තු විද්‍යාවේදී/විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

පූර්ණ වෘත්තීය සුදුසුකම (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය ලබා තිබීම)

සටහන : මෙම සුදුසුකම් 7.2.3.2 සටහන යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන්ට පමණක් අදාළ වේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.2.2.5 වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම

III. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විවෘත තරඟ විභාගය සඳහා දෙවතාවකට වඩා පෙනී නොසිටීම.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7.2.3 **වයස :**

7.2.3.1 අවම සීමාව : අවුරුදු 21

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35

සටහන : 7.2.2.2 හි සුදුසුකම් ලබා ඇති රජයේ සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක ප්‍රතිඵල මත

ලිඛිත විභාගයේදී සියළු විෂයන් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේ දී ලබාගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් ලත් අයදුම්කරුවන් බඳවාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | 100 | 40 |

(පරිශිෂ්ඨය 2 බලන්න)

7.2.4.1.1 පවත්වන බලධාරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම් :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නිර්මිත පරිසරය පිළිබඳව උපාධියක් ලබා ඇති රජයේ සේවයේ වසර පහ (05)ක ස්ථිර හා සතුටුදායක සේවා කාලයක් සහිත සංවර්ධන සහකාරවරු.

II. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සම්මත පාඨමාලාව - 1 කොටස සමත් රාජ්‍ය සේවයේ වසර 10ක් සහිත පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන්

සහ

උසස්වීම් ලත් දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ සැලසුම් ශිල්පීන්.

7.3.2.2 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.3.2.3 වෙනත් :

I. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

II. උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

III. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සීමිත තරඟ විභාගය සඳහා දෙවරකට වඩා පෙනී නොසිටීම.

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන්ට ලබාදෙන ලකුණු ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු වලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

7.3.3.1 ලිඛිත විභාගය

| ***විෂයයන්*** | ***උපරිම ලකුණු ප්‍රමාණය*** | ***සමත් ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|
| වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම | 100 | 40 |
| පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40 |

(පරිශිෂ්ඨය 3 බලන්න)

7.3.3.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

7.3.3.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ

7.3.3.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කෙරේ.

| ***පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර*** | ***උපරිම ලකුණු ප්‍රමාණය*** | ***සමත් ලකුණු ප්‍රමාණය*** |
|---|---|---|
| I. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| II. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| III. වෘත්තීය පළපුරුද්ද | 55 | |
| IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

7.3.3.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.3.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ

08. **කාර්යක්ෂමතා කඩඉම**

8.1

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉමේ ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර සමත් විය යුතු ය. | "4 වන පරිශිෂ්ඨය" |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගතවීමට පෙර සමත් විය යුතු ය. | "4 වන පරිශිෂ්ඨය" |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 05ක් ගතවීමට පෙර සමත් විය යුතු ය | "4 වන පරිශිෂ්ඨය" |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වසරකට දෙවරක් පැවැත්වේ.

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද,

1 වන කාර්යක්ෂමතා කඩඉම - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින්

2 වන කාර්යක්ෂමතා කඩඉම - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය මගින් පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ගැනීම (මෙය නිලධාරියා විසින් ලබා ගත යුතු ය.)

3 වන කාර්යක්ෂමතා කඩඉම - පූර්ණ වෘත්තිය සුදුසුකම් පවත්වාගෙන යාම (මෙය නිලධාරියා විසින් පවත්වාගෙන යා යුතු ය)

09. **භාෂා ප්‍රවීණතාව**

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත් වූ නිලධාරියෙකු තනතුරේ ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය |
| සන්ධාන භාෂාව | සේවය ස්ථිර කිරීමට පෙර අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් සමත් වී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු යි. (වෛකල්පිත විෂයයන් වශයෙන් නොවේ.) |

10. **ශ්‍රේණි උසස් කිරීම**

10.1 සේවයේ III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධානය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
V. සන්ධාන භාෂා ප්‍රවීණතා මට්ටම ලබාගෙන හෝ එයින් නිදහස් කරනු ලැබ තිබීම
VI. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VII. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II වන ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 සේවයේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හත (07)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා තිබීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම

V. වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතු ය.

10.2.1.1 උසස් කිරීමේ ක්‍රමය ඃ

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. වාස්තු විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතු ය.

II. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක නිලධර ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම.

III. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ/තනතුරුවලට අදාළ විධායක ශ්‍රේණියේ වසර 18කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 5 තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

V. පූර්ණ වෘත්තීය සුදුසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අධි සාමාජිකත්වය ලබාගෙන තිබීම.

VI. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් වී නොතිබීම.

10.3.1.1 උසස් කිරීමේ ක්‍රමය

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර එහි ප්‍රතිඵල අනුව අදාළ ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. සම්මුඛ පරීක්ෂණවලදී ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගනු ලැබේ.

III. පවත්නා පුරප්පාඩුවලට අනුව ඉහළම ලකුණු ලබාගත් නිලධරයන් පත්වීම් බලධරයා විසින් අදාළ සේවා ගණයට පත් කරනු ලැබේ.

11. **තනතුරු වලට පත් කිරීම**

11.1 සුදුසුකම්

| තනතුරු | සුදුසුකම් |
|---|---|
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II ශ්‍රේණියේ තනතුරු | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II ශ්‍රේණිය හෝ ඉන් ඉහල ශ්‍රේණියක නිලධාරියකු වීම |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරු | සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියකු වීම |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු | සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම |

11.2 තොරාගනු ලබන ක්‍රමය

(අ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II ශ්‍රේණියේ තනතුරු — සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියේ තනතුරු වලට පත් කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ තනතුරු — සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලබන නිලධාරීන් I වන ශ්‍රේණියේ තනතුරුවලට පත් කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.)

(ඇ) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු — සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්න අතුරින් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලබන නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත් කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.)

ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීම සඳහා සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. සේවා පළපුරුද්ද | 55 | අදාළ නොවේ |
| 2. කුසළතාවය | 40 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසළතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

12. **සේවයට අදාළ කොන්දේසි**

12.1 සේවය ස්ථිර කිරීමේ කොන්දේසි :

(අ) විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගන්නා ලද නිලධාරියෙකු වසර තුනක (3) පරිවාස කාලයකට යටත් වේ. ඔහු/ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම් සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු/ඇය පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

(ආ) සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරියෙකු එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ලබන අතර ඔහු/ඇය වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම්, ඔහු/ඇය වැඩ බැලීමේ කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.2 පුහුණුව හා සංවර්ධනය

(අ) මාස 3ක සේවාරම්භක පුහුණුවක් ලබා දෙනු ලැබේ.

(ආ) අධ්‍යක්ෂ (වාස්තු විද්‍යාඥ සේවා) විසින් සංවිධානය කොට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලැබේ.

13. **අර්ථ නිරූපණය හා නිර්වචන :**

I. "**සේවා ව්‍යවස්ථාව**" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය වේ.
II. "**ක්‍රියාත්මක වන දිනය**" යන්නෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.
III. "**සේවය**" හෝ "**ශ්‍රී. ලං. වා. වි. සේ.** " යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය වේ.
IV. "**ලේකම්**" යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.
V. "**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය**" යනුවෙන් අදහස් කරනුයේ 1976 අංක 01 දරන පනත යටතේ ස්ථාපිත කොට ඇති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයයි.
VI. "**පූර්ණ වෘත්තීය සුදුසුකම්**" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයෙහි III වන කොටසෙහි වෘත්තීය පරීක්ෂණය සමත්ව එම ආයතනය ආශ්‍රිත සාමාජිකත්වය ලැබ වරලත් වාස්තු විද්‍යාඥයෙක ලෙස ලියාපදිංචි වී එම තත්ත්වය පවත්වා ගෙන යාමයි.

VII. "**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**" යනුවෙන් අදහස් කරනුයේ 1982 අංක 09 දරන පනත යටතේ ස්ථාපිත කොට ඇති ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයයි.

VIII. "**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**" හෝ "**රා. සේ. කො.**" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

IX. "**සතුටුදායක සේවා කාලය**" රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මාලාවේ 186 ප්‍රකාරව අර්ථ කථනය වේ.

X. "**සක්‍රීය සේවා කාලය**" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේ ය.

14. **බඳවා ගනු ලබන්නේ සේවයේ III වන ශ්‍රේණියට පමණි. බඳවාගනු ලබන සංඛ්‍යා තීරණය කරනු ලබන්නේ අදාළ වර්ෂයේ ජූනි 30 දිනට එම සේවයේ වාර්තා වන පුරප්පාඩු සංඛ්‍යාව අනුව ය.**

15. **අන්තර්ග්‍රහණ විධිවිධාන**

නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට අයත් නිලධාරීන් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේවතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධන දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිට වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතු ය.

I. සේවයේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීම
ක්‍රියාත්මක වන දිනට සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ සිටින නිලධාරීන්

II. සේවයේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීම
ක්‍රියාත්මක වන දිනට සේවයේ II වන පන්තියේ I වන ශ්‍රේණියේ සිටින නිලධාරීන්

III. සේවයේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහනය කිරීම
(අ) ක්‍රියාත්මක වන දිනට සේවයේ I වන පන්තියේ නිලධාරීන්
(ආ) ක්‍රියාත්මක වන දිනට සේවයේ අධි සේවක පදනම යටතේ පළවන ශ්‍රේණියට පත්කර ඇති නිලධාරීන්

16. මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයක් ද සියළු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබාගත යුතු ය.

17. සෑම පත්වීමක් සම්බන්ධයෙන් රා. සේ. කො. සභාව මගින් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

18. **විධිවිධාන සලසා නොමැති කරුණු**

මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන වලට පරිබාහිර වූ කරුණු පිළිබඳ තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අමාත්‍ය මණ්ඩලය විසින් බලය පවරනු ලබන පරිපාලන බලධරයා විසින් ගනු ලබනු ඇත.

19. **වෙනත් :**

මෙම සේවා ව්‍යවස්ථාවෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත් වල කරුණු අතර යම් අනනුකූලතාවයක් ඇති වුව හොත් සිංහල පිටපත බලාත්මක වේ.

1 වන පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණිය, II ශ්‍රේණිය, III ශ්‍රේණිය**

| *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව* | *තනතුර* | *ශ්‍රේණිය* | *අනුමත සංඛ්‍යාව* |
|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 03 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශක සේවා)<br>අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)<br>ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ<br>වාස්තු විද්‍යාඥ | විශේෂ ශ්‍රේණිය<br>I ශ්‍රේණිය<br>I ශ්‍රේණිය<br>II/III ශ්‍රේණිය | 01<br>01<br>02<br>10 |
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ (වා. වි. සංරක්ෂණ)<br>නි. අ./ස. අ. (වා. වි. සංරක්ෂණ) | I ශ්‍රේණිය<br>II/III ශ්‍රේණිය | 01<br>03 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)<br>නි. අ. (වාස්තු විද්‍යාඥ)/ස. අ. | I ශ්‍රේණිය<br>II/III ශ්‍රේණිය | 01<br>02 |
| වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව | නි. අ./ස. අ. (වාස්තු විද්‍යා සංරක්ෂණ) | II/III ශ්‍රේණිය | 01 |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | වාස්තු විද්‍යාඥ (උද්‍යාන සැලසුම්) | II/III ශ්‍රේණිය | 01 |
| බස්නාහිර පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 13 |
| දකුණු පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 03 |
| වයඹ පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 03 |
| උතුරු මැද පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 02 |
| මධ්‍යම පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 03 |
| සබරගමුව පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 02 |
| ඌව පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 02 |
| උතුරු පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 01 |
| නැගෙනහිර පළාත් සභාව | වාස්තු විද්‍යාඥ | II/III ශ්‍රේණිය | 01 |

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013.06.30 දිනට අනුමත කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ තනතුරු උපලේඛනය අනුව)

2 වන පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය**

01. **විභාග පරිපාටිය සහ විෂය නිර්දේශයන්** - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය පැය* |
|---|---|---|---|---|
| 01. | බුද්ධි පරීක්ෂණය | 100 | 40 | 01 |
| 02. | සාමාන්‍ය දැනීම | 100 | 40 | 02 |

02. **විභාග පරිපාටිය** - විභාග මාධ්‍යය

(අ) මෙම විභාගය සිංහළ, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

සටහන

(i) සියළුම අපේක්ෂකයන් මෙම විභාගය සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර 02 සඳහා පෙනී සිටිය යුතු ය.

(ii) අපේක්ෂකයන් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.

(iii) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

03. **විෂය නිර්දේශය**

**විෂය අංක 01** - බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, ගැටළු විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ කුසලතාවය, විනිශ්චය කිරීම අරමුණු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

**විෂය අංක 02** - සාමාන්‍ය දැනීම

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු ද, ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් අවබෝධය ද පරීක්ෂා කිරීම අරමුණු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. පළමු කොටස කෙටි ප්‍රශ්න වලින් සමන්විතය. ඒ සඳහා ලකුණු 25කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න 8කින් ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතු අතර ඒ සඳහා ලකුණු 75කි.

3 වන පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට බඳවාගැනීම සඳහා වන සීමිත තරග විභාගය**

01. **විභාග පරිපාටිය සහ විෂය නිර්දේශයන්** - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය (පැය)* |
|---|---|---|---|---|
| 01 | වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම | 100 | 40 | 03 |
| 02 | පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40 | 02 |

02. **විභාග පරිපාටිය** - විභාග මාධ්‍යය

(අ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

සටහන

I. සියළුම අපේක්ෂකයන් මෙම විභාගය සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර 02 සඳහා පෙනී සිටිය යුතු ය.

II. අපේක්ෂකයන් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.

III. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

IV. වරකදී බඳවා ගනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

03. **විෂය නිර්දේශය**

විෂය අංක 01 - වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් පරිදි සකස් වේ.

කාලය පැය තුනයි

I හා II කොටස් වලින් අනිවාර්යය ප්‍රශ්න දෙකකට ද (ලකුණු 20 බැගින්) අනෙක් කොටස් තුනේ ප්‍රශ්න 6න් හතරකට ද පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 15 බැගින්)
සමත් ලකුණු ප්‍රමාණය 40%

I **කොටස** - රාජ්‍ය අංශයේ වාස්තු විද්‍යාඥයකුගේ ප්‍රායෝගික භූමිකාව

1. රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය අතර වාස්තු විද්‍යා පරිචයෙහි වෙනස
2. වාස්තු විද්‍යාඥ භූමිකාවේ පරාසය වාසි සහ අවාසි
3. ජනතාව කෙරෙහි වන වගකීම්
4. සංවිධානය කෙරෙහි වන වගකීම්

II **කොටස** -

1. මූලික අධ්‍යයනයන් හා විමර්ශන
2. සංකල්පමය නිර්මාණය හා මූලික ඇස්තමේන්තු සඳහා වන ප්‍රවේශය
3. රීති සැලසුම්කරණය හා ගොඩනැඟීම සහ අවශ්‍ය අනුමැතීන් හා පැහැදිලි කිරීම් ලබා ගැනීම
4. අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුමතිය ලබා ගැනීම සඳහා සකස් කළ යුතු සැලසුම් කට්ටලය
5. වාස්තු විද්‍යාත්මක විස්තරාත්මක ක්ෂේත්‍රය සැලසුම් සහ පිරිවිතර
6. අනෙකුත් උපදේශකවරුන් (ව්‍යුහ සැලසුම් සහ සේවා සැලසුම්) සමඟ සම්බන්ධීකරණයෙන් විස්තරාත්මක දත්ත සකස් කිරීම

III **කොටස** - සංවිධානයේ කාර්යයන් සහ මෙහෙයුම් මාධ්‍යය

1. සංවිධානයේ දැක්ම හා මෙහෙවර
2. සංවිධානයේ භූමිකාව හා කාර්යයන්
3. සංවිධාන ව්‍යුහය
4. සංවිධානයේ කාර්යයන් ඉටු කිරීමේදී එහි එක් එක් අංශයන්ගේ රාජකාරී හා වගකීම් හා අන්තර් සම්බන්ධතා
5. අනෙක් රාජ්‍ය ආයතන සමඟ ඇති සම්බන්ධතා

IV **කොටස** - ව්‍යාපෘතියේ පූර්ව ඉදිකිරීම් අවධිය තුළ ව්‍යාපෘතියට වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය

1. ලන්සු ලියකියවිලි හා ආයතන ඇස්තමේන්තු
2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්
3. පූර්ව ටෙන්ඩර් රැස්වීම් හා ටෙන්ඩර් කටයුතු
4. තාක්ෂණික ඇගයුම් හා ටෙන්ඩර් මණ්ඩල වර්ග
5. ගිවිසුම් හා කොන්ත්‍රාත් පිරිනැමීම

V **කොටස** - ව්‍යාපෘති ක්‍රියාත්මක ක්‍රියාවලිය තුළ හා පසු කොන්ත්‍රාත් අවධිය තුළ වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය

1. වැඩ බිමෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම්
2. තත්ව පාලන ක්‍රියා පරිපාටි
3. ඉදිකිරීමේ කණ්ඩායම සමඟ සම්බන්ධිකරණ පවත්වා ගැනීම
4. නිර්මිත පරිසරය තක්සේරු කිරීම හා පශ්චාත් විශ්ලේෂණ කටයුතු
5. නඩත්තු අත්පොත්

විෂය අංක 02 - පොදු ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය පැය 02කට සීමා කෙරේ. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.

I කොටස - සියළුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

II කොටස - ආර්ථික දේශපාලනික සංස්කෘතික සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධනේ වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.

ප්‍රශ්න පත්‍ර ව්‍යූහය ෘ

ඉහත ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න බහුවරණ හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හෝ ඒවායේ සංකලනයෙන් යුක්ත විය හැක.

4 වන පරිශිෂ්ටය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සඳහා පැවැත්වෙන 8 වන ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය විෂය නිර්දේශය**

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III පන්තියට පත් කරන ලද නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය

1. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

   I. මූල්‍ය ක්‍රම
   II. පරිපාලනය
   III. දෙපාර්තමේන්තු රෙගුලාසි

2. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර තිබේ.

3. සෑම ප්‍රශ්න පත්‍රයකම කාලය පැය තුනක් වන අතර සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම උපරිම ලකුණු 100කි.

4. විභාග පරිපාටිය

   I. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය

   පහත සඳහන් විෂය ක්ෂේත්‍ර ආවරණය වන එක් ප්‍රශ්න පත්‍රයකි.

   (අ) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය

   * රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන
   * රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
   * අරමුදල් යන්නෙහි අර්ථය
   * ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය
   * විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
   * අනිවිශ්චිත අවස්ථා අරමුදල
   * වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරීත්වය
   * රාජ්‍ය ආදායම
   * මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය
   * භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
   * වොරන්ට් හා අග්‍රිම අධිකාරිය
   * විගණකාධිපති ඔහුගේ බලතල හා කාර්යභාරය

* රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)
* පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

(ආ) ගණන් දීමේ නිලධාරීන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගණන් දීමේ නිලධාරීන් පත්කිරීම, එම නිලධාරීන්ගේ බලතල හා කාර්යභාරය/වගකීම් හා වගකීම් ස්වභාවය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) රාජ්‍ය වියදම් සැලසුම් කරණය හා කළමනාකරණය

* සංවිධාන වල අරමුණු හා කාර්යභාරයන් හඳුනාගැනීම
* රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩසටහන් හඳුනා ගැනීම
* සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැලසුම් කිරීම හා ඇගයීම් ප්‍රමුඛතාකරණය
* වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තුව සැකසීම සහ අවසන් තීරණ ගැනීම

(ඉ) අනුමත ඇස්තමේන්තු වල වෙනස්කම් කිරීම

* විරමෝං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
* රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
* මූළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
* පරිපූරක ඇස්තමේන්තු

(ඊ) රජයේ දේපල වල පාඩු හා අත්හැරීම්

(උ) විවිධ ගිණුම් කටයුතු

(ඌ) (මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම)

(එ) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය

(ඒ) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

* රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය
* රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

සටහන - අපේක්ෂකයෙකු ලකුණු 40% ලබාගත යුතු ය.

II. පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(අ) ආයතන සංග්‍රහයේ පරිච්ඡේද
I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

(ආ) අංක 30/1589 දරන 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති

සටහන - අපේක්ෂකයෙකු ලකුණු 40% ලබාගත යුතු ය.

III. දෙපාර්තමේන්තු රෙගුලාසි

දෙපාර්තමේන්තු රෙගුලාසි වෙනස්වන නිසා මෙම සේවයේ සියළු නිලධාරීන්ට පොදු පරීක්ෂණයක් පැවැත්වීම අපහසු වේ. එබැවින් මෙම විෂය සඳහා විෂය නිර්දේශ සකස් කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ඇතිව අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් එම පරීක්ෂණය පැවැත්වීමට අදාළ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියාකළ යුතු ය.

**දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II ශ්‍රේණියට උසස්වී වසර තුනක් ඇතුළත අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු ය. එනම් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සාමාජිකත්වය ලබා ගත යුතු ය. (සේවයට බැඳෙන අවස්ථාවේ පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇති නිලධාරීන් එය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.)

**තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

පූර්ණ වෘත්තීය සුදුසුකම් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.

09-408

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

3—G 20130